

# කුරුළු පිහාටුවක් මෙන්.....

සැහැල්ලුවෙන්
පාවී යන්න...

එන්න අපිත් එක්ක
වෙළඳ කලාපයෙන් එළියට
රවුමක් යන්න....

# ඔබ

**නිවසින්, පාසැලට...**

**පාසැලෙන් කෙලින්ම වෙළඳ කලාපයට**

රැකියාවක් සඳහා වෙළඳ කලාපය

තෝරාගත්තේ.....

**ජීවිතයේ රස විඳින්නද...?**

**ජීවිතය විඳවන්නද...?**

**කොහොමත් ගමට වඩා මෙහෙ හොඳයි...?**

නිදහස, විලාසිතා, අතට සල්ලි, කරට මාල, හදිසියෙන් පොඩි ජොලියක්..
රෑට ප්‍රවීනා, ගෞතමී, මහගෙදර, සුපර් ස්ටාර්, සෙල් ෆෝන්,
ගෙදර යන ගමන් ''ෆුඩ් සිටි''
මේ ඔක්කොම එකම තැනක...
ගෙදර ඇති දහසක් වැඩ, දහසක් ප්‍රශ්න මොහොතකටවත් අමතක කරන්න පුළුවන් නම්...

**හෙට දවස ලස්සන කරගන්නයි මේ පෙරුම් පුරන්නේ...?**

රස ගුණ ගැන නොසිතා... මොනව හරි ගිල දමා දවස තල්ලු කරමින්...
හුළං හැමුවේ නැති වුනත්, දවාලට ඉන්න බැරි වුනත්.. සැමන් වගේ හිරවුනත්...
නාන්න කරන්න හොඳට බැරි වුනත්... ලාබ බෝඩිමේ මේ තපින්නේ........
අවුරුදු පහක් ගෙවන්නට පෙරුම් පුරාගෙන
පොදි බැඳ ගන්න මිසක් ආසාවට නම් නොවෙයි....

**ඒ...**

හෙට දවස ලස්සන කරගන්නයි...?



# හෙටට පෙර...
# අද දවස

අද දවසට වඩා හෙට දවස ගැන
කවුරුත් උනන්දුයි
ඒ නිසාම අද දවසේ හුඟක් දේවල් මඟහැරීම
හැමෝගේම පුරුද්දයි.....

**නමුත් අද මගහරින දේ හෙට ලබා ගන්න පුළුවන් වේවිද..?**

කාලයක් තිස්සේ අපි වගේම හැමෝම අද දවසේ දේවල්
මඟ හැරීම නිසා අපිට ගොඩක් දේවල් අද මඟ හැරිලා...

**ආයෙමත් ලංකරගන්න බැරි තරමටම...**

***අනාගතයේ දවසක ඒ උදාවෙන සුන්දර දිනයක් වෙනුවෙන්***
***දහසක් බලාපොරොත්තු තබමින්..........***

කටවහගෙන, කරබාගෙන, වටා පිටාව ගැන අවබෝධයකින් නොසිටි නිසා,
අද මනුෂ්‍යයන් ලෙස නොසලකන පිරිසක් බවට ඔබ පත්වෙලා....
රටට ප්‍රධාන විදේශ විනිමය උපයාදෙන ශ්‍රමිකයන් වන ඔබ
කලාපයේ බඩු, ගාමන්ට් කෑලි වෙලා....

යහපත් සේවා ස්ථානයක්, රැකියාවට සරිලන වැටුපක්, යහපත් නේවාසිකාගාරයක්, කාරුණික නිළධාරීන්, යහපත් ප්‍රවාහන සේවයක්, විශ්වාසයකින් ප්‍රතිකාර ලබා ගත හැකි රෝහලක්, මේ සියල්ල අද සිහිනයක්.....?

**ජීවිතය කියන්නේ සිහිනයක්...**
**සිහිනයක් නැත්නම් ජීවිතයක් තිබේද...?**

ජීවිතේ....... සිහින සැබෑකර ගන්න පියවි සිහියෙන් ඉන්න...
අද දවසේ වැඩේ අදම කරන්න...හෙටට කල් නොදන්න...

**අපි කැමතියි ඔබේ සිහිනය සැබෑ කරන්න ඔබට උදව් කරන්න...**
ඒ ඔබට... සිහිනයක් තිබේ නම් පමණක්...
**අපට ලියන්න කතාකරන්න...**


**Right to Life මානව හිමිකම් මධ්‍යස්ථානය,**
අංක 555, කොළඹ පාර, කටුනායක
දුරකතන/ෆැක්ස් 031 4870308, 2221604 (නිලාෂනී, ප්‍රසංග)


නැවත හමුවෙමු....